# විශ්ව සාහිත්‍යයේ විකාශනනය හා ශිෂ්ඨාචාරය




යම් ලිවීමක් හෝ ලියමනක් ගද්‍ය හෝ පද්‍ය ස්වරූපයකින් කාලාන්තරයක් තිස්සේ විකාශනය වෙමින් පාඨකයා, අසන්නා හෝ අධ්‍යයනය කරන්නාට සතුටක් අවබෝධයක් හෝ මග පෙන්වීමක් දෙන්නේ නම්, සාහිත්‍ය උපදින්නේ එතැනිනි. විවිධ සාහිත්‍යයමය වි බිහිවන්නේ ද එතැනිනි. එසේනම් සාහිත්‍යයේ ඉතිහාසය ආරම්භ වන්නේ ද යලි යලිත් ලියවෙන්නේ ද එවන් ලියමන් ඇරඹෙන තැනින්මය. එනමුත් සෑම ආකාරයකම වු ලියමන් සාහිත්‍යය ගණයට වැටෙන්නේ ද නැත. එහෙයින් විශ්ව සාහිත්‍යයේ ඇරඹුම සහ විකාශනය පිළිබඳව අද මා මේ ලියන ලියමනද සාහිත්‍යයයමය ලියමනක් නොවන වග ඉඳුරාම කිමට කැමැත්තෙමි. මෙය හුදෙක් සාහිත්‍යය පිළිබඳ ලියැවෙන්නක් පමණි.

සාහිත්‍යය සහ ලිවීම එකිනෙකින් වෙන් කළ නොහැකි මුත් ඒවා එකිනෙකට පර්යාය පද ලෙසද සැලකිය නොහැකිය. ඒ අනුව ඉතිහාසයේ මුල්ම යුගයන්හි මුලින්ම ලියවුනා යැයි සැලකෙන පුරාතන සමරියානු ලියමන් (Sumer) හෝ දකුණු මෙසපොතේමියානු ලියමන් (වර්ථමානයේ දකුණු ඉරාකය) හෝ පුරාණ ඊජිප්තු රූපාක්ෂර (Egyptian hieroglyphics ) හෝ දහස් ගණනින් වූ පෞරාණික චීන ලියමන්, සාහිත්‍යාංග ලෙස කිසිසේත්ම සාධාරණීකරණය කළ නොහැකිය. සියවස් ගණනකට පෙර ලෝකයෙහි සංස්කෘතීන් සහ භාෂාවන්ගේ විවිධත්වයත්, රාජ්‍යයන්ගේ හුදකලාභාවයත් හේතුවෙන් ලොව සියලු දේශයන්හි සාහාත්‍යයයේ විකාශනය එකම ආකාරයකට සිදුවුයේ නැත. සමහර සාහිත්‍යය නිර්මාණ ශතවර්ෂ ගණනාවක් ඔස්සේ අහම්බෙන් හෝ බලහත්කාරයෙන් සිදු වු විනාශයන්ට බඳුන් වී ඇත. සමහරක් ඒ ඒ සංස්කෘතීන් තුළ අතුරුදහන්වීම්වලට බඳුන් වූ බවද පර්යේශණ වලින් පැහැදිලි වේ. මෙබඳු හේතුන් නිසා විශ්ව සාහිත්‍ය පිළිබඳව වූ එකම ඉතිහාස කතාවක් ගොඩනැගීමද අසීරුය. එහෙත් එවන් ඉතිහාසයක් පිළිබඳ ග්‍රන්ථගත වූ තොරතුරු බොහොමයක් නොතිබුනාම ද නොවේ. එහෙත් අද පොතපත පරිශීලනය කරන්නන්ගේ අවාසනාවටදෝ ඓතිහාසික වටිණාකමකින් යුත් බොහොමයක් සාහිත්‍ය නිර්මාණ ලෝකයට අහිමි වී ඇත. නිදසුනක් ලෙස, ක්‍රිස්තු පූර්ව පළවෙනි සියවසේදී කලාවට උරුම දෙවි දුවරුන් නවදෙනා වෙත පුදන ලදැයි කියන, ඇලෙක්සැන්ඩ්‍රියාවේ රාජකීය ග්‍රන්ථාගාරය දැක්විය හැක. ක්‍රිස්තු පූර්ව තුන්වන ශතවර්ශයේ සිට ක්‍රිස්තු පූර්ව තිස්වන සියවසේ රෝමානු අභිබවනය තෙක්ම ටොලමි රාජ්‍යවංශිකයන්ගේ අනුග්‍රහකත්වයෙන් විරාජමාන වූවායැයි සැලකෙන එම අතිවිශාල ග්‍රන්ථාගාරය (පුස්තකාලය) පසු කාලීනව වරින් වර විවිධ හේතුන් මත ගිණිතැබීම් වලට භාජනය වූ බව ඊජිප්තු ඉතිහාස කතාවන්හි සඳහන් වේ.(මෙම සුවිශේෂී ග්‍රන්ථාගාරය පිළිබඳව ඇති විචිත්‍ර වු අදහස්, මිථ්‍යා මත සහ වෙනත් තොරතුරු පිළිබඳ ඉදිරියේදී වෙනම ම ලිපියකින් තොරතුරු ගෙන ඒමට අපේක්ෂා කරමි.) තවත් සමහර සාහිත්‍යයමය ලේඛණ (සහ සමහර ලේඛකයන්ද) ඒ ඒ කාලවල තිබු අධ්‍යාත්මික සහ ලෞකික සංවිදානයන් විසින් වාරණය කොට විනාශ කර දැමු අවස්ථාද ඉතිහාසයේ බොහෝ තැන්වල අනාවරනය වී ඇත.

ඉහත දැක්වූ කරුණු එසේ වුවද සාහිත්‍ය රස කළඹන මුල් කාලීන සුවිශේෂ සාහිත්‍ය සටහන් සමහරක් විනාශයන්ට බඳුන් නොවී හුදකලාව කෙසේ හෝ සුරැකී පැවති බවක් ද දක්නට ඇත. ආදිතම උදාහරණ ලෙස ක්‍රි.පු. 2000 දී පමණ සමරියානු බසින් ලියවුනා යැයි සැලකෙන ගිල්ගමේෂ් වීර කාව්‍ය හා පැපිරස් ශාක කොටස් අනුසාරයෙන් නිපදවුයේ යැයි කියන පත්‍රිකා විශේෂයක් මත ක්‍රි.පු.1800 දී පමණ ඊජිප්තු රූපාක්ෂර යොදා ලියවුනු "මළවුන්ගේ පොත" (book of the Dead) සඳහන් කළ හැකිය.

විශ්ව සාහිත්‍යයේ ඉතිහාසය පිළිබඳ කෙරුණු මුලික හැදෑරීම් වලට ඓතිහාසික ඊජිප්තු සාහිත්‍ය ඇතුලත් වුයේ නැත. මීට හේතු වුයේ දහනව වෙනි සියවස තෙක්ම ඓතිහාසික ඊජිප්තු සාහිත්‍ය ලියමන් යුරෝපා බසකට පරිවර්ථනය නොවීමය. මුඛ පරම්පරාවෙන් කාලාන්තරයක් පැවතී පසුකාලීනව ග්‍රන්ථගත වූ සාහිත්‍යාංගයන් එසේ ලියවුනු කාලයක් සඳහන් කිරීම ද අසීරුය.

සම්භාවනීයත්වයේ ආරම්භය ලෙස සැලකෙන හෝමර්ගේ ඉලියඩ් සහ ඔඩිසි කාව්‍යයන් ද්විත්වය ක්‍රි.පු. අටවන සියවසේ ලියවෙන්නට ඇතැයි සැලකෙන අතර ඒවා ලෝකඩ යුගයේ (Bronze Age) සිට කටවහරින් පැවතගෙන එන වීර කාව්‍යයන් බවද කියවේ. සෘග් වේදයට පසු ලියවුනේ යැයි සැලකෙන හින්දු පුජනීය සෘති (Sruit) සටහන්ද, හීබෘ තනාක් (Hebrew Tanakh) ලෙස හැඳින්වෙන හීබෘ බයිබල් සටහන්ද, චීන දාර්ශනිකයෙකු හා කවියෙකු වන ලාඕ චී ගේ (LaoTzi) බවට හඳුනාගෙන ඇති ගුප්ත කාව්‍ය සංග්‍රහයද ඇතුලත් වන්නේ අයස් සමයට යැයි (Iron Age) කියවෙන නමුත්, ඒවාට කාලයක් නිර්ණය කිරීම මතභේදයට තුඩු දෙන්නක් වේ. මෞර්ය සමයට පෙර ලියවුන, මුඛ පරම්පරාවෙන් පැවත ආ හින්දු වීර කාව්‍යයන්ටද කාල වකවාණු නිර්ණය කළ නොහැකිය.

සාහිත්‍යයේ ඉතිහාසය ශිෂ්ඨාචාරය හා බැඳී ඇති බවද, ඊජිප්තු හා සමරියානු සාහිත්‍ය ලොව ඉපැරණිම සාහිත්‍ය නිර්මාණ බවද ඉහත කරුණු සැලකීමේදී අවබෝධ වේ. අතීත ඊජිප්තුවේ මූලික සාහිත්‍යාංගය වී ඇත්තේ කවිය බව උපදේශාත්මක සටහන්,ස්තෝ්‍රර,යාඥා හා කතාන්තර නිරීක්ෂණය කිරීමේදී පෙනී යයි. ඒවා සියල්ල ගද්‍යට වඩා පද්‍යට බොහෝ සමීප බව පැහැදිලිය. නමුත් පද්‍යයේ ඡන්දස් හඳුනාගත නොහැකිය.




පුරාණ චීනයේ මුල් සාහිත්‍යාංග දර්ශණය ඉතිහාසය හා සමුදාන්යායන් මුල් කොට ගෙන ලියවුනු අතර, ඉන්දියානු සාහිත්‍ය පදනම් වුවේ මුඛ පරම්පරාවෙන් පැවත ආ නාට්‍ය, වීර කාව්‍ය, වේදයන් හා සුත්‍රයන්ය. ග්‍රීක සාහිත්‍ය පදනම් වුනේ හෝමර්ගේ වීර කාව්‍යයන් හා දේවවංශා වලින් මත වු අතර ශ්‍රේෂ්ඨ ග්‍රීක සාහිත්‍යාංග අතර නාට්‍ය,කවි,දර්ශනය,ඉතිහාසය හා ප්‍රහසන කලාව ද අඩංගු විය.

නාගරීකරණය වු සංස්කෘතිකාංගත් සමගම ප්‍රේක්ෂකයින් ද පාඨකයින් ද ගණනින් විශාල වන්නට විය. එහි ප්‍රතිඵලයක් ලෙස නාට්‍ය හා ප්‍රහසණ කලාවද වර්ධනය විය. වීර කාව්‍යයන් වෙනුවට භාවාතිශ්‍ය කවි රාජ සභාවන් හා ප්‍රභූ පෙළැන්තීන් අතර ජනප්‍රිය වන්නට විය. එය වඩාත් ප්‍රචලිත වූයේ විවිධ පද්‍යයන් හා ගීතාවලීන් ඒක රාශී කළ ප්‍රභූන් විසු චීනය වැනි නැගෙනහිර ආසියාතික රටවල් වලය.

නාගරීකරණය වේගවත්වත්ම විවිධ විද්වත් මණ්ඩප විසින් චීන, ඉන්දියානු,පර්සියානු හා ග්‍රීක රෝම ශිෂ්ඨාචාරයන් තුල ශේෂව පැවති සාහිතයානුසාරයෙන්,කාල්පනික හා දාර්ශනික විධිරම යටතේ විශ්ව සාහිත්‍ය හඳුනා ගන්නටත් හඳුන්වා දෙන්නටත් උත්සුක වනු දක්නට ලැබුනි. පන්වන්තරය හා ඔවිඩ්ගේ විපරිත කාව්‍යයන් (Metamorphoses of Ovid) වැනි ආදිතම නිර්මාණයන් කෙරෙහිද ඔවුන්ගේ වැඩි අවදානයක් යොමු වුවේ ඒවා තුළ උපදේශාත්මක හෝ චිත්ත ධෛර්යය උපදවීමේ අරමුණ ද දක්නට තිබු නිසා විය හැකිය.

දහඅට වන සියවසේදී යුරෝපීය සංස්කෘතීන්ගේ බලපෑම විශාල වශයෙන් අනෙකුත් රටවල ද ප්‍රසාරණය වන්නට පටන් ගෙන තිබුණි. එම සියවසේ අග භාගය වන විට විලියම් හිල් බ්‍රවුන්ගේ "ද පවර් ඔෆ් සිම්පති" (1789) වැනි ආරම්භක ඇමරිකානු සාහිත්‍ය නිර්මාණ කෙරෙහි ලෝක අවදානය යොමු වන්නට විය. ගොතේ සහ ෂිලර්ගේ ස්ටර්න් උන්ඩ් ඩ්‍රැංග් (Sturn and drang) නම් වු නිදහස් රොමාතික ප්‍රබන්ධකරණ හා කාව්‍යකරණ ව්‍යාපාර සහ නොවලිස් (Novalis) වැන්නන්ගේ සාහිත්‍ය සටහන් හා නිර්මාණත් සමගම ජර්මානු රොමාන්තික සාහිත්‍යයේ ආරම්භයද දහඅට වන සියවසේ අග භාගයේදී සිදු විය.

නාට්‍ය හා ඔපෙරාව සමග සමාන්තරව නව කතාව, කෙටි කතාව සහ සගරා, පාඨකයන් සහ ප්‍රේක්ෂකයන් අතර ප්‍රචලිත විමත්, රූපවාහිනි, ගුවන් විදුලි හෝ සිනමාවක් එවකට නොතිබීමත් හේතුවෙන් ලිඛිත නිර්මාණ ජනප්‍රියත්වයේ ඉහලටම එසවුනු දහ නමවනව සියවස, විශ්ව සාහිත්‍යයේ ස්වර්ණමය යුගය බවට අනුමාණ කළ හැකිය. ප්‍රේමය හා විරහව පිළිබඳ බොහෝ දේ ලියවුනු එම යුගයේදී ගවේශනාත්මක, රහස් පරීක්ෂක, විද්‍යාත්මක හා අධිතාත්වික ප්‍රබන්ධකරණය හා කාව්‍යකරණය කෙරෙහිද නිර්මාණකරුවන්ගේ වැඩි නැමියාවක් දක්නට ලැබුනි. එහි ප්‍රතිඵලයක් ලෙස 1807 දී තෝමස් මුවර්ගේ "අයිරිෂ් මෙලඩීස්" ද, 1810 සර් වොල්ටර් ස්කොට්ගේ "ලේඩි ඔෆ් ද ලේක්" ද 1811 ජේන් ඔස්ටින් ගේ "සෙන්ස් ඇන්ඩ් සෙන්සිබිලිටි" ද පාඨකයින්ට දායාද කරන ලදී. එකල බිහි වූ තවත් විශිෂ්ඨ නිර්මාණ අතර, ඇලෙක්සැන්ඩර් ඩුමාගේ "ද ත්‍රි මස්කටියර්ස්" නිකොලායි ගොගොල්ගේ "ද ගවර්මන්ට් ඉන්ස්පෙක්ටර්" (1836), එඩ්ගා ඇලන් පෝ ගේ "ද කොන්කරර් වර්ම්" (1837), එමිලි බ්‍රොන්ට්ගේ "වදරින්ග් හයිට්ස්"(1847),වික්ටර් හියුගෝගේ "ලේ මිසරබල්ස්" (1862) සහ ලියෝ ටෝල්ස්ටෝයිගේ " වෝ ඇන්ඩ් පීස්"(1869) ඇතුලු අති විශිෂ්ඨ නිර්මාණ රැසක් වේ.

